17
පාඩම
सप्तदशः पाठः

# වචන සොයමු; කොටු පුරවමු

## 17.1 අභ්‍යාසය

ගුරුතුමාගේ සහාය ඇතිව පහත සඳහන් ප්‍රහේලිකාව පුරවන්න. අවශ්‍ය තැන්වල හල් අකුරු භාවිත කළ හැකි ය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 शा | | 2 | ■ | 3 | 4 | ति |
| ■ | ■ | 5 | 6 | प्र | | ■ |
| 15 | ■ | 7 तु | | ■ | ■ | 8 |
| 9 | 10 | | ■ | 11 | | व |
| ■ | | ■ | ■ | | ■ | |
| 12 | न् | | | ■ | 14 | |
| 15 | | | ■ | 16 | | म् |

හරහට

1. පණිවිඩය යන අරුත් දෙයි.
3. වෙනස් වූ ස්වරූපය යන අර්ථය දෙයි.
5. දිනපතා යන අදහස ප්‍රකාශ වේ.
7. තුමන්ත ක්‍රියා සාදා ගැනීමට යෙදෙන ප්‍රත්‍යයයි.
9. මිලදී ගන්නට යන අරුත දෙයි.
11. මුහුද යන තේරුම දෙන පදයකි.
12. දිග හැරීමට යන අදහස දෙන තුමන්ත ක්‍රියාවකි.
14. බොනු මැනවි යන අදහස දෙයි.
15. අදහස/කල්පනාව යන තේරුම දෙයි.
16. යාමට යන අදහස දෙයි.

පහළට
2. නාද කිරීමට යන අරුත දෙයි.
3. බමුණාට කියන නමකි.
4. කරන ලද නිර්මාණය යන තේරුම දෙයි.
6. වඳියි/ නැමෙයි යන අදහස දෙන සංස්කෘත ක්‍රියාපදයේ ක්‍රියා ධාතුවයි.
8. උසස් ලෙස කීමට යන අදහස දෙන සෝපසර්ග තුමන්ත ක්‍රියාවකි.
10. පහර දෙති යන අදහස දෙයි.
11. අනුව/ පිටුපසින් වැනි තේරුම් දෙන උපසර්ග පදයකි.
12. ඉතා වැඩි යන අර්ථය දෙන තද්ධිත ප්‍රත්‍යයකි.
14. ආරක්ෂා කෙරේවා යන තේරුම දෙයි.
15. රෝද දෙක යන අරුත දෙන නපුංසක ලිංග ද්විවචන පදයකි.

## 17.2 අභ්‍යාසය

1. පහත දී ඇති වාක්‍ය සිංහලයට නගන්න.

१. स्वामी भृत्यानां वेतनं दत्वा सम्भाषति ।

२. धीता शुनकाय अन्नं दातुं गृहाद् आगच्छति ।

३. उपासिका हस्ते पुष्पाणि धृत्वा विहारं याति ।

४. मारुतेन पर्वतं कम्पितुं न शक्नोति ।

५. दायकाः बुद्धं पूजयित्वा स्थूपम् अर्चयितुं गच्छन्ति ।

६. बालकाः मत्स्यान् दृष्ट्वा ग्रहीतुं यतन्ते ।

७. श्रामणेरौ गुरुं नत्वा तेन सह कथयितुं इच्छतः ।

८. जनाः लगुडं गृहीत्वा चोरं  ताडयितुं धावन्ति ।

९. बुद्धः नागद्वीपं गत्वा नागान् दन्तुं धर्मं अदेशयत् ।

१०. ते बौद्धउपासकाः भूत्वा पञ्चशीलं रक्षितुं शपथं अकुर्वन् ।

2. පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අකුරින් ලියන්න.

1. සාමණේර හිමිවරු පිණ්ඩපාතය රැගෙන විහාරයට එති.
2. ගුරුවරු උගන්වන්නට පිරිවෙනට යති.
3. ශිෂ්‍යයෝ පාඩම් හදාරන්නට පන්තියට එති.
4. වැසි කාලයේදී වැහි වලාකුළු ගිගුරුමට පටන් ගනී.
5. ඇත්තු දිය බී කැලයට යති.
6. වඳුරෝ ගසින් ගසට ගොස් ගෙඩි කන්නට කැමති වෙති.
7. පියා ළිඳක් සාරන්නට මිත්‍රයෙකු කැඳවයි.
8. මිත්‍රයා ළිඳ සාරා ජලය ගන්නට වෙහෙසෙයි.
9. ශිෂ්‍යයා පාඩම කියවා පිටපත් ලියන්නට සිතයි.
10. ළමයා මවට ද පියාට ද වැඳ පාසල් යන්නට ගෙයින් නික්මෙයි.

## 17.3 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පිරවීමට වඩාත් ම සුදුසු පූර්වක්‍රියා පදය හෝ තුමන්ත ක්‍රියාපදය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවා අභ්‍යාස පොතේ නැවත ලියා ගුරුතුමා ලවා හරි වැරදි ලකුණු කරවා ගන්න.

2. ගුරුතුමාගේ උපදෙස් ඇති ව වාක්‍ය සිංහලයට පෙරළන්න.

१. श्रामणेराः प्रातरेव प्रबुध्य मुखं ............................ विहारं ............................ पूजाद्रव्याणि सज्जीकुर्वन्ति । ( क्षालयित्वा , क्षालयितुं / गन्तुं , गत्वा )

२. आचार्यः छात्रेभ्यः प्रतिग्रहान् अयच्छत् । ते ......................... शीर्षं ........................... तान् अलभन् । ( हसितुं , हसित्वा / नन्तुं , नत्वा )

३. अश्वाः वेगेन ............................ समर्थाः । ते दूरगमनं ............................ उपयुज्यन्ते । ( धावित्वा , धावितुं / यातुं , यात्वा )

४. धर्माशोकराजा धर्मेण राष्ट्रं ............................ धर्मोपदेशान् शैलेषु ............................ सर्वत्र स्थापयत्। ( पालयित्वा , पालयितुं / लिखितुं , लिखित्वा )

५. कृषीवलाः क्षेत्रेषु कर्माणि ........................ सायाह्ने गृहं ........................ विश्रामयन्ति। ( कृत्वा , कर्तुं / गत्वा , गन्तुं )

६. शकुनाः आकाशे ............................ एव च भूमौ कीटान् ............................ खादितुं च समर्थाः भवन्ति। ( डयितुं , डयित्वा / गृहीत्वा, ग्रहीतुं )

७. विदेशिकाः नगरे रथेषु ............................ भाण्डानि ............................ इच्छन्ति। ( चरितुं , चरित्वा / क्रीत्वा , क्रेतुं )

८. मुनयः वने ............................ पिण्डाय ग्रामं ............................ चिन्तयन्ति। ( उषित्वा, उषितुं / आगम्य , आगन्तुं )

භාවිතයට

कोतिभारः समर्थानाम् - किं दूरं व्यवसायिनाम् ।
को विदेशः सविद्यानाम् - कः परः प्रियवादिनाम्॥

දක්ෂයන්ට බරක් කියා දෙයක් නැත. වෘත්තිකයන්ට දුර කියා දෙයක් නැත. විද්වතුන්ට විදේශය කියා වෙනසක් නැත. ප්‍රිය වචන කියන්නන්ට පිට අය කියා කෙනෙකු නැත.